# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1846/18 - 2014 ජනවාරි මස 21 වැනි අඟහරුවාදා - 2014.01.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 21/1978(x).

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය යටතේ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන අමාත්‍ය, දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක වන මම, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කරන ලද සහ ලියාපදිංචි අංක පීබී 148 දරන සණස කැම්පස් ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70 ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙම නියමය මගින් සහ මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, උසස් අධ්‍යාපනය සංවර්ධනය කිරීමේ කාර්යය සඳහා මෙහි II වන උපලේඛනයේ I වන තීරයෙහි නිශ්චිතව දක්වා ඇති උපාධි පාඨමාලා පිරිනැමීමට සහ ඊට අනුරූපව මෙහි II වන උපලේඛනයේ II වන තීරයෙහි සඳහන් උපාධි කෙටි නාම ලබාදීම සඳහා සණස කැම්පස් ලිමිටඩ් ආයතනය උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් පිළිගනිමි.

I වන උපලේඛනය

*අදාළවන කොන්දේසි*

උපාධි ප්‍රදානය කිරීමේ තත්ත්වය ප්‍රදානය කළ දින සිට පළමුවන මාස හයක කාලය අවසන්වීමට පෙර සණස කැම්පස් ලිමිටඩ් ආයතනය විසින් නිශ්චිත බලධරයා වන උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය :-

(1) මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති එක් එක් විශේෂ උපාධි පාඨමාලාවන් සඳහා, විෂයය පිළිබඳ විශේෂඥ මණ්ඩලයක් විසින් පරීක්ෂා කරන ලද පාඨමාලා අන්තර්ගතය, සම්මාන අගයන්, සහ ඇගයීම් ක්‍රම ඇතුළත් සම්පූර්ණ පාඨමාලා ව්‍යුහය.

(2) අතුරු නීතීන් සහ අභ්‍යන්තර තත්ත්ව සහතිකකරණ යාන්ත්‍රණය

(3) සංවර්ධිත විෂයය යොමු සලකුණු ප්‍රකාශයන්.

(4) ඉගැන්වීම් - ඉගෙනුම් ක්‍රියාවලිය තුළට ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම ඇතුළත් කිරීම හා ඒ සම්බන්ධයෙන් ආචාර්යවරුන් පුහුණු කිරීම පිළිබඳ සාක්ෂිය.


1A - PG 1928 — 560 (2014/01)

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

II වන උපලේඛනය

| *I වන තීරය* | *II වන තීරය* |
|---|---|
| උපාධි වැඩසටහන් | උපාධිය සඳහා වන කෙටි යෙදුම් |
| බැංකුකරණය සහ මුල්‍ය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය | බී. එස්. සී. (විශේෂ) බැංකුකරණය සහ මුල්‍ය. |
| රක්ෂණ සහ අවධානම් කළනාකරණය පිළිබඳ (විශේෂ) උපාධිය | බී. එස්. සී. (විශේෂ) රක්ෂණ සහ අවධානම් කළමනාකරණය. |
| ප්‍රාදේශීය විද්‍යා සහ සැළසුම් පිළිබඳ (විශේෂ) උපාධිය. | බී. එස්. සී. (විශේෂ) ප්‍රාදේශීය විද්‍යා සහ සැළසුම්. |

දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2014 ජනවාරි මස 21 වැනි දින,
කොළඹ දී ය.

02-41

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.